# රාජ්‍ය සේවයේ ලොක්කෝ පක්ෂ සහ අපේක්ෂක ප්‍රවර්ධනයේ යෙදෙනවා

## -ෆැෆරල් කියයි

චමින්ද සිල්වා

මාණ්ඩලික සහ අධීක්ෂණ ශ්‍රේණියේ ඇතැම් රාජ්‍ය නිලධාරීන් දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයන් ප්‍රවර්ධන කටයුතුවලට සෘජුවම හා වක්‍රව සම්බන්ධ වන බවට තොරතුරු ලැබී ඇතැයි ෆැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා ඊයේ (26 දා) පැවසීය.

මැතිවරණ රාජකාරි කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටුකරන රාජ්‍ය සේවයේ ඉහළ තනතුරු දරන මෙම නිලධාරීන් දේශපාලන ප්‍රවර්ධන කටයුතුවලට සම්බන්ධ වීම නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා බාධාවක් බව ද ඒ මහතා අවධාරණය කර සිටී.

මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද නියෝග අනුව්ද ආයතන සංග්‍රහය අනුව්ද මාණ්ඩලික ශ්‍රේණියේ සහ අධීක්ෂණ ශ්‍රේණියේ නිලධාරීන්ට, ඡන්දය භාවිත කිරීම හැර වෙනත් කිසිදු ආකාරයක දේශපාලන ක්‍රියාවක නිරතවීම තහනම් බව ද ඒ මහතා කීය.

මෙම නිලධාරීන් නිසියාකාරව රාජකාරියේ නිරත වන්නේ නම් දේශපාලනඥයන්ට රාජ්‍ය බලය හෝ දේපළ අවභාවිතා කිරීමට නොහැකි බව ද හෙට්ටිආරච්චි මහතා වැඩිදුරටත් කියා සිටී.